සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2022 (2023)
General Certificate of Education (Adv. Level) Examination, 2022 (2023)

**නූතන ලෝක ඉතිහාසය II (I කොටස)**
நவீன உலக வரலாறு II (பகுதி I)
Modern World History II (Part I)

**25 C S II**

**පැය තුනයි**
*மூன்று மணித்தியாலம்*
*Three hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**නූතන ලෝක ඉතිහාසය - ක්‍රි.ව. 1500 සිට 1989 දක්වා**

**විභාග අංකය:** ..................................

**උපදෙස්:**

* මෙම ප්‍රශ්න පත්‍රය **I** හා **II** ලෙස කොටස් **දෙකකින්** සමන්විත වේ.
* **I කොටසෙහි 1 - 40** දක්වා ප්‍රශ්න **සියල්ලටම මෙම පත්‍රයේ ම ලබා දී ඇති උපදෙස් පරිදි** පිළිතුරු සපයන්න.
* **I කොටසෙහි** නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු **එක** බැගින් හිමි වේ.
* කොටස් **දෙකට ම** මුළු කාලය **පැය තුනකි.** පිළිතුරු ලියා අවසන් වූ පසු **I කොටස**, **II කොටසේ** පිළිතුරු පත්‍ර සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

* අංක **1** සිට **10** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ **නොගැළපේ.** එම **නොගැළපෙන** නම කුමක් දැ'යි හඳුනාගෙන එහි **අංකය වරහන තුළ** ලියන්න.

**1.** (1) අද්‍රියාතික් (2) ආර්ක්ටික් (3) අත්ලාන්තික්
(4) ඉන්දියන් (5) පැසිෆික් (......)

**2.** (1) හොකයිඩෝ (2) හොන්ෂු (3) හොංකොං
(4) ෂිකොකු (5) කියුෂු (......)

**3.** (1) ජිනෝවා (2) මිලාන් (3) වෙනිස්
(4) ෆ්ලොරන්ස් (5) විටෙන්බර්ග් (......)

**4.** (1) ජියෝටෝ (2) මසච්චියෝ (3) බොටිචෙලි
(4) මකියාවෙලි (5) මයිකලාංජිලෝ (......)

**5.** (1) වර්ජිනියා (2) කැලිෆෝර්නියා (3) නිව් හැම්ප්ෂයර්
(4) නිව්යෝර්ක් (5) නිව් ජර්සි (......)

**6.** (1) සුන් යත් සෙන් (2) චියැං කායි ෂෙක් (3) හෝ චි මිං
(4) චෞ එන් ලායි (5) ඩෙන් ෂියාඕපිං (......)

**7.** (1) වුඩ්රෝ විල්සන් (2) විට්ටෝරියෝ ඕර්ලැන්ඩෝ (3) ලොයිඩ් ජෝර්ජ්
(4) ජෝර්ජ් ක්ලෙමන්සෝ (5) ෆ්‍රැන්ක්ලින් රූස්වෙල්ට් (......)

**8.** (1) රාජේන්ද්‍ර ප්‍රසාද් (2) ජවහර්ලාල් නේරු (3) සර්වපල්ලි රාධක්‍රිෂ්ණන්
(4) නීලම් සන්ජීව රෙඩ්ඩි (5) රාමස්වාමි වෙන්කතරාමන් (......)

[දෙවැනි පිටුව බලන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**9.** (1) බ්‍රිතාන්‍ය පොදු රාජ්‍ය මණ්ඩලය
(2) ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO)
(3) ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO)
(4) ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO)
(5) එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානය (UNESCO) (……)

**10.** (1) හර්යානා (2) රාජස්ථාන් (3) ගුජරාට්
(4) අරකන් (5) කේරළ (……)

- අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එක්** යුගලයක පද **එකිනෙකට නොගැළපේ**. එම **නොගැළපෙන** යුගලය කුමක් දැ'යි හඳුනාගෙන, ඊට අදාළ **අංකය**, ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**11.** (1) යුප්‍රටීස්-ටයිග්‍රීස් - ඉරාකය
(2) නයිල් - ඊජිප්තුව
(3) සින්ධු - පාකිස්ථානය
(4) හ්වැං හෝ - චීනය
(5) ගංගානම් - බුරුමය (……)

**12.** (1) පුනරුදය - ඉතාලිය
(2) ආගමික ප්‍රතිසංස්කරණය - ජර්මනිය
(3) දේශ ගවේශණ - අයිබීරියන් අර්ධද්වීපය
(4) ප්‍රබුද්ධත්වය/ආලෝකනය - නෙදර්ලන්තය
(5) සමාජවාදී විප්ලවය - රුසියාව (……)

**13.** (1) ගෝව - පෘතුගීසි
(2) ඉන්දුනීසියාව - ලන්දේසි
(3) මලයාව - ස්පාඤ්ඤ
(4) වියට්නාමය - ප්‍රංශ
(5) පිලිපීන දූපත් - අමෙරිකානු (……)

**14.** (1) මිං - කාම්බෝජය
(2) මැන්චු - චීනය
(3) ටොකුගාවා - ජපානය
(4) න්ගුයෙන් - වියට්නාමය
(5) චක්‍රි - සියම (……)

**15.** (1) ඉරානය - පර්සියාව
(2) මියන්මාරය - ලාඕසය
(3) ඉරාකය - මෙසොපොතේමියාව
(4) තායිවානය - ෆෝර්මෝසා
(5) බංග්ලාදේශය - නැගෙනහිර පාකිස්ථානය (……)

- අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් **X** සහ **Y** තීරවල දී ඇත. **Y** තීරයේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු **X** තීරයේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට **නොවේ**. **Y** තීරය, **X** තීරය සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත ඇති සංයෝග පහෙන් **එකක්** නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන තුළ** ලියන්න.

**16.**

| X | | Y | |
|---|---|---|---|
| (i) | නිකොලෝ මකියාවෙලි | A | "සියලු රටවල කම්කරුවනි, එක්වව්!" |
| (ii) | ජීන් ජැක් රූසෝ | B | "කුමාරයා හිවලා සහ සිංහයා අනුකරණය කළ යුතු ය." |
| (iii) | කාල් මාක්ස් | C | "සියයක් මල් පිපේවා, සියයක් චින්තන ධාරා සටන් වදීවා!" |
| (iv) | වින්ස්ටන් චර්චිල් | D | "මිනිසා නිදහස්ව උපත ලබා ඇති නමුත් ඔහු හැම තැනම යදීමින් බැඳ දමා ඇත." |
| (v) | මාඕ සේතුං | E | "බෝල්ටික් සිට අද්‍රියාතික් දක්වා මහාද්වීපය හරහා අයෝමය කඩතුරාවක් වැටී ඇත." |

(1) ABCDE (2) BADEC (3) BDAEC (4) ECDBA (5) EDACB (……)

[තුන්වැනි පිටුව බලන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

17.

| X | | Y |
|---|---|---|
| (i) | විප්ලවයේ දරුවා | A ෆ්ලොරන්ස් නයිටිංගේල් |
| (ii) | පහන අතින් ගත් කාන්තාව | B වික්ටෝරියා රැජිණ |
| (iii) | ඉන්දියාවේ අධිරාජිණිය | C මාගරට් තැචර් |
| (iv) | පාකිස්තානයේ පියා | D නැපෝලියන් බොනපාට් |
| (v) | යකඩ ගැහැණිය | E මුහම්මුද් අලි ජින්නා |

(1) DABEC (2) DACBE (3) DEACB (4) ECDAB (5) EDBCA (……)

18.

| X | | Y |
|---|---|---|
| (i) | නිදා සිටින යෝධයා | A ඉතාලිය |
| (ii) | සාප්පුකාර ජාතිය | B චීනය |
| (iii) | හුදු භූගෝලීය ප්‍රකාශයක් පමණකි | C බ්‍රිතාන්‍යය |
| (iv) | කිරීටයේ මාණික්‍යය | D තුර්කිය |
| (v) | යුරෝපයේ රෝගියා | E ඉන්දියාව |

(1) ACEBD (2) BCAED (3) BEACD (4) BEDCA (5) DEACB (……)

19.

| X | | Y |
|---|---|---|
| (i) | බුරුමය | A මකාරියෝස් |
| (ii) | මැලේසියාව | B සුකර්ණෝ |
| (iii) | සයිප්‍රස් | C කෙනත් කවුන්ඩා |
| (iv) | ඉන්දුනීසියාව | D තුන්කු අබ්දුල් රහමන් |
| (v) | සැම්බියාව | E ඌ නු |

(1) CEABD (2) DAEBC (3) DEBAC (4) ECADB (5) EDABC (……)

20.

| X | | Y |
|---|---|---|
| (i) | ජාතීන්ගේ සංගමය | A හේග් |
| (ii) | එක්සත් ජාතීන්ගේ සංවිධානය (UNO) | B වොෂිංටන් |
| (iii) | ජාත්‍යන්තර අධිකරණය (ICJ) | C නිව්යෝර්ක් |
| (iv) | ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) | D රෝමය |
| (v) | ලෝක ආහාර වැඩසටහන (WFP) | E ජිනීවා |

(1) ACBED (2) BDAEC (3) CADBE (4) ECABD (5) EDABC (……)

- අංක **21** සිට **25** තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක් අදාළ මාතෘකාවට නොගැළපේ.** එය තෝරා, ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**21. පෙරදිග ලන්දේසි යටත් විජිත අධිරාජ්‍යය**

(1) දහසයවන සියවස අවසානයේදී ලන්දේසීහු පෙරදිග ඉන්දීය දූපත්වලට පැමිණියහ.
(2) ලන්දේසි පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගම 1602දී පිහිටුවන ලදී.
(3) පෙරදිග ලන්දේසි අධිරාජ්‍යයේ මූලස්ථානය ගෝවේ පිහිටුවා තිබුණි.
(4) යාන් පිටර්සෝ කුන් පෙරදිග ලන්දේසි යටත් විජිත අධිරාජ්‍යයේ ප්‍රධාන නිර්මාතෘවරයා ලෙස සලකනු ලැබේ.
(5) ලන්දේසීහු ඉංග්‍රීසීන් පෙරදිග ඉන්දීය දූපත්වලින් පළවා හැරියහ. (……)

**22. එංගලන්තයේ උත්කෘෂ්ට විප්ලවය**

(1) දෙවන ජේම්ස් සිහසුනෙන් නෙරපා හරින ලදී.
(2) මේරි සහ තුන්වන විලියම් එංගලන්තයේ ඒකාබද්ධ පාලකයෝ බවට පත්වූහ.
(3) උත්කෘෂ්ට විප්ලවය එංගලන්තයේ ව්‍යවස්ථානුකූල රාජාණ්ඩුවක් සඳහා පදනම දැමී ය.
(4) ඔලිවර් ක්‍රොම්වෙල් අගමැතිවරයා ලෙස පත් කරන ලදී.
(5) අයිතිවාසිකම් පනත ප්‍රකාශයට පත් කෙරිණ. (……)

[හතරවැනි පිටුව බලන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**23.** **කාර්මික විප්ලවය**

(1) බ්‍රිතාන්‍යයේ ආරම්භ විය.

(2) කාර්මික විප්ලවය මගින් කෘෂිකාර්මික ආර්ථිකය, යාන්ත්‍රික නිෂ්පාදනයෙන් පාලනය වන නාගරික ආර්ථිකයක් බවට පරිවර්තනය කෙරිණි.

(3) කාර්මීකරණය මුලින්ම රෙදිපිළි කර්මාන්තයේ සිදු විය.

(4) කාර්මික විප්ලවය බ්‍රිතාන්‍යයේ සිට මහාද්වීපික යුරෝපයට ව්‍යාප්ත විය.

(5) බ්‍රිතාන්‍යයෙන් පසු කාර්මීකරණය වූ මුල්ම යුරෝපීය රට පෘතුගාලයයි. (......)

**24.** **ඉන්දියාවේ ජාතික ව්‍යාපාරය**

(1) 1857 බ්‍රිතාන්‍ය විරෝධී ජනතා නැගීසිටීම

(2) ඉන්දියාවේ පාලන බලය නැගෙනහිර ඉන්දියා වෙළෙඳ සමාගමෙන් කිරීටය වෙත පැවරීම

(3) ඉන්දියානු ජාතික සංගමය පිහිටුවීම

(4) 'සහයෝගිතා වර්ජන' (Boycott) සහ 'ස්වදේශී' ව්‍යාපාර

(5) 'ඉන්දියාවෙන් පිටව යනු' ව්‍යාපාරය (......)

**25.** **චීනයේ කොමියුනිස්ට් ව්‍යාපාරයේ නැගීම**

(1) චීනය තුළ කොමියුනිස්ට් වාදය කෙරෙහි තිබූ උනන්දුව, 1917 රුසියානු විප්ලවයෙන් පිබිදීමකට ලක් විය.

(2) චීන කොමියුනිස්ට් පක්ෂය 1921දී පිහිටුවන ලදී.

(3) යුද්ධාධිපතීහු චීන කොමියුනිස්ට් පක්ෂයට ආධාර කළහ.

(4) කොමියුනිස්ට්වරු සුප්‍රසිද්ධ සැතපුම් 6000 දීර්ඝ පා ගමන 1934දී ආරම්භ කළහ.

(5) චීන කොමියුනිස්ට්වරු 1949දී ජයග්‍රහණය කළහ. (......)

- අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති **(A)**, **(B)**, **(C)** හා **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක්** හෝ **කිහිපයක්** හෝ නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරා,

**(A)** සහ **(B)** පමණක් නිවැරදි නම් ........................................... **1** ද,
**(A)** සහ **(C)** පමණක් නිවැරදි නම් ........................................... **2** ද,
**(B)** සහ **(C)** පමණක් නිවැරදි නම් ........................................... **3** ද,
**(C)** සහ **(D)** පමණක් නිවැරදි නම් ........................................... **4** ද,
**වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් ............ **5** ද **වරහන තුළ** ලියන්න.

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| **1** | **2** | **3** | **4** | **5** |
| **(A)** සහ **(B)** පමණක් නිවැරදි ය. | **(A)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(B)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(C)** සහ **(D)** පමණක් නිවැරදි ය. | **වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදිය. |

**26.** පෙරදිග ස්පාඤ්ඤ යටත් විජිත අධිරාජ්‍යය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය/ ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) පෙරදිග ස්පාඤ්ඤ යටත් විජිත අධිරාජ්‍යය පිලිපීන දූපත් වෙත කේන්ද්‍රගතව පැවතුණි.

(B) ස්පාඤ්ඤ අධිරාජ්‍යයේ මූලාස්ථානය බතාවියාවේ පිහිටුවා තිබුණි.

(C) ස්පාඤ්ඤයෝ යටත් වැසියන් අතර කතෝලික ආගම ප්‍රචාරය කිරීමට විශේෂ උනන්දුවක් දැක්වූහ.

(D) ලන්දේසීන් විසින් ස්පාඤ්ඤයන් පිලිපීන දූපත්වලින් නෙරපා දමන ලදී. (......)

**27.** සිංගප්පූරුව සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය/ ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) සිංගප්පූරුව දහනවවන සියවසේ සිට ලන්දේසි පාලනය යටතේ පැවතුණි.

(B) සිංගප්පූරුව 1959දී නිදහස ලබාගත්තේ ය.

(C) සිංගප්පූරුව ලී ක්වාන් යූ විසින් පාලනය කරන ලදී.

(D) ලී ක්වාන් යූ ගෙන් පසුව මහතීර් බින් මොහොමඩ් පාලනයට පත් විය. (......)

[පස්වැනි පිටුව බලන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**28.** අග්නිදිග ආසියාවේ ප්‍රංශ යටත් විජිත අධිරාජ්‍යය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය/ ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) ඉන්දු-චීනය ප්‍රංශයන් විසින් ජයග්‍රහණය කිරීම දහනවවන සියවසේ දෙවන භාගයේදී සිදු විය.
(B) දෙවන ලෝක යුද්ධ සමයේදී ඉන්දු-චීනය ජපානය විසින් යටත් කරන ලදී.
(C) වියට් මිං හමුදා ප්‍රංශයන්ට එරෙහිව සටන් කළහ.
(D) ඉන්දු චීනයේ ප්‍රංශ පාලනය 1954 ජිනීවා සම්මේලනයෙන් නිම කරනු ලැබීය. (……)

**29.** බොල්ෂෙවික් විප්ලවය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) බූර්බෝන් රාජාණ්ඩුව පහ කරන ලදී.
(B) 'සාමය, ඉඩම් හා පාන්' යන්න විප්ලවයේ ප්‍රධාන සටන් පාඨය විය.
(C) 'නිර්ධන පන්ති ආඥාදායකත්වයක්' ලෙනින් යටතේ පිහිටුවනු ලැබීය.
(D) 'රතු කමිස' හමුදාව ස්ටාලින් යටතේ සංවිධානය කොට තිබුණි. (……)

**30.** එක්සත් ජාතීන්ගේ සංවිධානය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) එක්සත් ජාතීන්ගේ සංවිධානය 1945 දී පිහිටුවන ලදී.
(B) එහි ප්‍රධාන අරමුණ වන්නේ ලෝක සාමය සුරැකීමයි.
(C) මහ සභාව සහ ආරක්ෂක මණ්ඩලය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධාන ආයතන දෙකකි.
(D) ඩැග් හැමර්ෂල් එහි ප්‍රථම මහලේකම් ලෙස සේවය කළේ ය. (……)

● අංක **31** සිට **35** තෙක් සෑම ප්‍රශ්නයකම නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**31.** විශ්වය පිළිබඳ සූර්ය කේන්ද්‍රීය න්‍යාය ඉදිරිපත් කරන ලද්දේ කවුරුන් විසින් ද?

(1) මයිකල් සර්වේටස් (2) නිකොලස් කොපර්නිකස් (3) ජොහැන්නස් කෙප්ලර්
(4) ගැලීලියෝ ගැලිලි (5) අයිසැක් නිව්ටන් (……)

**32.** "වැඩිම සංඛ්‍යාවකගේ වැඩිම සතුට" නම් ප්‍රකාශය සමඟ බැඳී පවතින න්‍යාය ධර්මය කුමක් ද?

(1) ධනවාදය (2) ලිබරල්වාදය (3) රාජ්‍ය නිර්බාධවාදය
(4) උපයෝගිතාවාදය (5) සමාජවාදය (……)

**33.** ඉන්දියාවේ 'ආර්ය සමාජ්' නම් සංවිධානය පිහිටුවන ලද්දේ කවුරුන් විසින් ද?

(1) රාම් මෝහොන් රෝයි (2) දයානන්ද සරස්වතී (3) බාල් ගංගාධාර තිලක්
(4) ස්වාමි විවේකානන්ද (5) ලාලා ලජ්පත් රායි (……)

**34.** 1870 සිට 1962 තෙක් ඇල්ජීරියාව පාලනය කළ යුරෝපීය රට කුමක් ද?

(1) ප්‍රංශය (2) එංගලන්තය (3) ඉතාලිය
(4) බෙල්ජියම (5) ජර්මනිය (……)

**35.** ඝානාවේ පළමුවන අගමැතිවරයා කවුද?

(1) පැට්‍රිස් ලුමුම්බා (2) ජූලියස් නියරේරේ (3) මිල්ටන් ඔබෝටේ
(4) ජොමෝ කෙන්යාටා (5) ක්වාමේ නිකෲමා (……)



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

- අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1, 2, 3, 4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලය දැ'යි තෝරා ඊට අදාළ **අංකය වරහන තුළ** ලියන්න.

| | පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| **1** | නිවැරදි ය. | වැරදි ය. |
| **2** | නිවැරදි ය. | නිවැරදි ය. |
| **3** | වැරදි ය. | වැරදි ය. |
| **4** | වැරදි ය. | නිවැරදි ය. |
| **5** | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

| | පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය | |
|---|---|---|---|
| **36.** | ප්‍රංශ පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගම 1600දී පිහිටුවන ලදී. | අබිං යුද්ධය අවසානයේදී ප්‍රංශයන් හා චීන ජාතිකයින් අතර නැන්කිං ගිවිසුම අත්සන් කරන ලදී. | (.........) |
| **37.** | පළමුවන ඉංග්‍රීසි-බුරුම යුද්ධය අවසානයේ අත්සන් කරන ලද යැන්ඩබෝ ගිවිසුමෙන් අරකන් හා ටෙනසරිම් බ්‍රිතාන්‍යයන් යටතට පත් කරනු ලැබීය. | දෙවන ඉංග්‍රීසි-බුරුම යුද්ධය අවසානයේ සමස්ත බුරුම දේශයම බ්‍රිතාන්‍ය ආධිපත්‍යය යටතට පත් විය. | (.........) |
| **38.** | බැස්ටීලය බිඳ හෙළීම රුසියානු විප්ලවයේ ආරම්භය සලකුණු කරයි. | වී. අයි. ලෙනින් 1921දී නව ආර්ථික ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීය. | (.........) |
| **39.** | පළමුවන ලෝක යුද්ධය නිම වීමෙන් පසු ජර්මනියේ ක්‍රියාත්මක කරන ලද වයිමාර් ආණ්ඩුක්‍රමයේ මූලික ලක්ෂණයක් වූයේ ප්‍රජාතන්ත්‍රවාදය කෙරෙහි තිබූ අවධාරණයයි. | ඡන්දයෙන් තෝරා පත් කර ගත් ජනාධිපතිවරයෙකු හා මන්ත්‍රී මණ්ඩල දෙකකින් යුත් ව්‍යවස්ථාදායකයක් ප්‍රධාන කොට ගත් සමූහාණ්ඩුවක් ප්‍රකාශයට පත් කළ වයිමාර් ආණ්ඩුක්‍රමයෙන් සර්වජන ඡන්දයට සහ කැබිනට් ආණ්ඩුක්‍රමයකට ප්‍රතිපාදන සකසා තිබුණි. | (.........) |
| **40.** | 1949දී කොමියුනිස්ට් හමුදා විසින් පරාජය කරනු ලැබීමෙන් පසු කුවොමින්ටැං හමුදා තායිවාන් දූපතට පළා ගොස් එහි චීන සමූහාණ්ඩුව නමින් හැඳින්වූ ආණ්ඩුවක් පිහිටු වූහ. | මුලදී තායිවානය එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළ චීනයේ නියෝජිතයා ලෙස පෙනී සිටි නමුත් 1971න් පසු එයට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය අහිමි විය. | (.........) |

* *



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022 (2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2022 (2023)
General Certificate of Education (Adv. Level) Examination, 2022 (2023)

නූතන ලෝක ඉතිහාසය II (II කොටස)
நவீன உலக வரலாறு II (பகுதி II)
Modern World History II (Part II)

25 C S II

**නූතන ලෝක ඉතිහාසය - ක්‍රි.ව. 1500 සිට 1989 දක්වා**

**උපදෙස්:**

* පිළිතුරු සැපයිය යුතු **මුළු** ප්‍රශ්න සංඛ්‍යාව **හතරකි.**
* **II කොටස A, B** හා **C** ලෙස කොටස් **තුනකින්** සමන්විත වේ.
* **A කොටසේ** ප්‍රශ්නය අනිවාර්ය වේ.
* **B** හා **C** කොටස්වලින් එක් කොටසකින් අවම වශයෙන් **එක** ප්‍රශ්නයක්වත් තෝරා ගෙන **තවත්** ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.
  (**පළමුවන** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **ලෝකයේ දළ සිතියමක් I කොටස** සමඟ සපයා ඇත.)

## A කොටස

**1.** ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.**

| | | |
|---|---|---|
| (i) පිරනීස් | (ii) නයිල් ගඟ | (iii) ජිබ්‍රෝල්ටාර් සමුද්‍ර සන්ධිය |
| (iv) කැස්පියන් මුහුද | (v) මිසිසිපි ගඟ | (vi) ජාවා |
| (vii) බ්‍රසීලය | (viii) ශාන්ත පීටර්ස්බර්ග් | (ix) නිව්යෝර්ක් |
| (x) කරච්චි | (xi) යුක්‍රේනය | (xii) පැනමා ඇළ |

*(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු **01** බැගින්)*

## B කොටස

**2.** "ජාතික රාජ්‍යය යනු පහළොස්වන හා දහසයවන සියවස්වල යුරෝපයේ මතු වූ සුවිශේෂී දේශපාලන සංවිධානයකි."

(i) ජාතික රාජ්‍යය යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැයි නිර්වචනය කරන්න. (ලකුණු 03 යි)

(ii) ජාතික රාජ්‍යයක අන්තර්ගත ප්‍රධාන අංගෝපාංග කවරේ ද? (ලකුණු 04 යි)

(iii) **එක්කෝ** ස්පාඤ්ඤයේ **නැතහොත්** එංගලන්තයේ ජාතික රාජ්‍යය වර්ධනය වූ ආකාරය ගෙනහැර දක්වන්න. (ලකුණු 09 යි)

**3.** (i) අමෙරිකානු විප්ලවය ඇතිවීමට තුඩු දුන් සාධක විග්‍රහ කරන්න. (ලකුණු 10 යි)

(ii) අමෙරිකානු විප්ලවයෙන් උද්ගත වූ ප්‍රතිඵල සැකෙවින් දක්වන්න. (ලකුණු 06 යි)

**4.** බිස්මාර්ක් විසින් ඉටුකරන ලද කාර්යභාරය අගයමින් ජර්මනිය එක්සත් කිරීමේ ප්‍රධාන අවස්ථා ගෙනහැර දක්වන්න. (ලකුණු 16 යි)

**5.** පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) පෘතුගීසි යටත් විජිත අධිරාජ්‍යය
(ii) ප්‍රංශ විප්ලවයේ බුද්ධිමය පසුබිම
(iii) 1848 විප්ලව
(iv) බොල්ෂෙවික් විප්ලවය ඇති වූ පසුබිම

(ලකුණු 08 × 2 = 16 යි)

[අටවැනි පිටුව බලන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

## C කොටස

**6.** මෙයිජි ප්‍රතිස්ථාපනයෙන් පසු විසිවන සියවසේ ආරම්භය තෙක් ජපානයේ සිදු වූ නවීකරණ ක්‍රියාදාමය පහත දැක්වෙන ක්ෂේත්‍ර යටතේ පරීක්ෂා කරන්න.

(i) සමාජ සහ ආර්ථික ක්ෂේත්‍ර

(ii) දේශපාලන හා ආණ්ඩුක්‍රම ක්ෂේත්‍ර (ලකුණු 16 යි)

**7.** "අන්තර් යුද්ධ සමයේ ඒකාධිපති පාලන තන්ත්‍ර නැගී ඒම දෙවන ලෝක යුද්ධය ඇතිවීම නොවැළැක්විය හැකි තත්ත්වයට බවට පත් කළේ ය."

(i) පළමුවන ලෝක යුද්ධය අවසන් කරමින් ජර්මනිය සමඟ අත්සන් කරන ලද ගිවිසුම කුමක් ද? (ලකුණු 01 යි)

(ii) ඉතාලියේ ෆැසිස්ට් නායකයා සහ ජර්මනියේ නට්සි නායකයා නම් කරන්න. (ලකුණු 02 යි)

(iii) ඉතාලියේ සහ ජර්මනියේ ෆැසිස්ට් හා නට්සි පාලන තන්ත්‍ර නැගී ඒම දෙවන ලෝක යුද්ධය ඇතිවීමට කොතෙක් දුරට හේතු වී ද? (ලකුණු 13 යි)

**8.** (i) තුෂ්ණි යුද්ධය යන්නෙන් අදහස් කරන්නේ කුමක් දැයි නිර්වචනය කරන්න. (ලකුණු 04 යි)

(ii) තුෂ්ණි යුද්ධය ආරම්භ වූ ආකාරය සහ කියුබන් මිසයිල අර්බුදය තෙක් තුෂ්ණි යුද්ධය ලෝක දේශපාලනය කෙරෙහි බලපෑ ආකාරය පරීක්ෂා කරන්න. (ලකුණු 12 යි)

**9.** පහත සඳහන් නායකයින් අතුරෙන් ඕනෑම **දෙදෙනෙකුගේ** ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) ජෝශප් ස්ටාලින්

(ii) මහත්මා ගාන්ධි

(iii) මාඕ සේතුං

(iv) අච්මඩ් සුකර්ණෝ

(ලකුණු 08 × 2 = 16 යි)

* * *

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022 (2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2022 (2023)
General Certificate of Education (Adv. Level) Examination, 2022 (2023)

| | | |
|---|---|---|
| නූතන ලෝක ඉතිහාසය II<br>நவீன உலக வரலாறு II<br>Modern World History II | 25C | S |

ප්‍රශ්න අංකය / வினா இல. / Question No. 1

විභාග අංකය / சுட்டெண் / Index No. ..............................




Download all Past Papers>  https://bookbeekid.com/resource/past-papers/